# ජනතා වතු සංවර්ධන මණ්ඩලය

## වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය

## ඇබෑර්තු

ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. තෝරාගන්නා ලද අයදුම්කරුවන් රජය විසින් නිකුත් කරන ලද හා ඉදිරියේදී නිකුත් කිරිමට අපේක්ෂිත අණ පණත් හා ආයතනික නීති රීති, රෙගුලාසි හා ප්‍රතිපත්තිවලට අනුකූලව තනතුරට අදාල කාර්යයන් ඉටුකිරීමට මනා හැකියාවක් ඇති අය විය යුතුය.

**<u>අභ්‍යන්තර විගණක - 01 තනතුරු</u>**

**තනතුරට පැවරෙන කාර්යයන් :-**

ආයතන සම්පත්, ආයතනික කාර්යයන් සහ මූල්‍ය කළමනාකරණය පිළිබද ක්‍රමවේදයන්ට අදාළ විගණන කටයුතු සැලසුම් කිරීම, මෙහෙයවීම, වාර්තා කිරීම සහ අභ්‍යන්තර පාලනය පිළිබද නිර්දේශය ඉදිරිපත් කිරීම, ක්‍රියාත්මකභාවය විමර්ශනය කිරීම.

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන් (පහත සුදුසුකම් 1 හෝ 2)**

1. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් වාණිජවේදී හෝ ගණකාධිකරණ උපාධියක් ලබා තිබීම. **සහ**

   උපාධිය ලබා ගැනිමෙන් පසු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එකක (01) පළපුරුද්දක් ලබා තිබීම.

2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැලපෙන්නා වූ, පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක අන්තර් මධ්‍යම පරීක්ෂණය සමත්වීම සහ සුදුසුකම් ලබා ගැනීමෙන් පසු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එක (01) ක පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් ( පහත 1 හෝ 2)**

1. ඉහත සදහන් බාහිර අයදුම්කරුවන් සදහා වන සුදුසුකම් සපුරා තිබීම.
2. "කණිෂ්ය කළමනාකාර" JM සේවා ගණයෙහි අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම.

**සේවා ගණය : " කළමනාකාර"**

**වැටුප් තලය : MM 1-1 - රු.(91,690/-10x 2,480/-15x 3,450/-168,240/-)**



**වයස** : අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම

වයස් සීමාව බල නොපායි.

**වෙනත් :-**

සෑම අයදුම්කරුවෙකුම,

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

ii. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන් ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

iii. විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.

**තනතුරට අදාල පොදු කොන්දේසි**

1. මෙම තනතුර ස්ථිර වන අතර විශ්‍රාම වැටුප් රහිතය.
   සේවක අර්ථසාධක අරමුදලට සේවකයාගෙන් 10% ක් සහ සේවායාගෙන් 12% ක්ද සේවක භාරකාර අරමුදලට සේවායාගෙන් 3% ක්ද දායකත්වය දරනු ලබයි.
2. රාජ්‍ය සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩලවල අයදුම්කරුවන් තම ආයතන ප්‍රධානීන් මගින් අයදුම්පත් ඉදිරිපත් කල යුතු වේ.
3. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ කුසලතා අනුපිළිවෙල මත තෝරා ගැනීම සිදු කෙරේ.
4. අයදුම්කරු පිළිබඳ වාර්තා ලබාගත හැකි ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් අයදුම්පත සමග ඉදිරිපත් කල යුතුය.
5. අධ්‍යාපන, වෙනත් සහතික පළපුරුද්ද පිළිබඳ සහතිකවල ඡායා පිටපත් අයදුම්පතට අමුණා එවිය යුතු වේ.
6. අයදුම්කරුවන් විසින් ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට සියළුම සුදුසුකම් සපුරා තිබිය යුතු වේ.

**අයදුම්කල යුතු ආකාරය**

මේ සමග සුදුසුකම් ඇති අයදුම්කරුවන් අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම් පළපුරුද්ද සහ පෞද්ගලික තොරතුරු යනාදිය ඇතුලත් ජීව දත්ත එවන ලියුම්කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි අයදුම් කරනු ලබන තනතුර සඳහන් කොට පහත සඳහන් ලිපිනයට 2026 .10.12 දිනට පෙර ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අපහැදිලි හා අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**ලිපිනය :**

**ජනතා වතු සංවර්ධන මණ්ඩලය**

**55/75, වොක්ෂෝල් වීදිය**

**කොළඹ - 02**

**විද්‍යුත් තැපැල - jedbhr2@gmail.com**